# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනත

[සහතිකය සටහන් කළේ 1975 අගෝස්තු මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 සැප්තැම්බර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනත

[සහතිකය සටහන් කළේ 1975 අගෝස්තු මස 26 වන දින]

එල්.ඩී.—ඔ. 35/73

**ශ්‍රී ලංකාවේ තක්සේරුකරුවන්ගේ ආයතනයක් පිහිටුවීම සඳහා ද ආයතනයේ කටයුතු මෙහෙයවීම, තදිය සාමාජිකයන්ගේ වෘත්තීය සේවා තත්ත්වයන් පාලනය කිරීම, ඒවා රැකගැනීම, ඔවුන්ගේ විනය පාලනය හා විනය ආරක්ෂාව යන මේ කරුණු සම්බන්ධයෙන් වග කිව යුතු තදිය සභාවක් පිහිටුවීම සඳහා ද ඒ හා සම්බන්ධයෙන් හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කෙරෙන නියමයක් මගින් නියම කරනු ලබන මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කෙරෙන දිනයක ක්‍රියාත්මක වන්නේ ය.

**ශ්‍රී ලංකා තක්සේරුකාර ආයතනය පිහිටුවීම.**

2. (1) (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කෙරෙන) "ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනය" යන නමින් යුත් ආයතනයක් පිහිටුවනු ලැබේ.

(2) මේ පනත යටතේ සාදනු ලබන රීතිවලට හෝ නියෝගවලට හෝ අනුකූලව ඇතුළත් කර ගනු ලබන්නා වූ ද නාම ලේඛනගත කරනු ලබන්නා වූ ද සංස්ථාගත වූ සහ සංස්ථාගත නො වූ සාමාජිකයෝ ආයතනයේ සාමාජිකයෝ වන්නාහ.

**ආයතනය සංස්ථාපනය කිරීම.**

3. මේ පනත ආරම්භ වන දිනයෙහි හා ඊට පසු, ආයතනයේ සංස්ථාගත සාමාජිකයන් ලෙස තත්කාලයෙහි නාම ලේඛනගත කරනු ලැබූ යම් හා යම් තාක් තැනැත්තන්, මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කෙරෙන සංස්ථාවක සාමාජිකයන් වන අතර ඔවුන්ගෙන් එය සංස්ථාපනය වන්නේ ය. එනමින් ම අඛණ්ඩ පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඔවුන්ට ඇති අතර, ස්වකීය අභිමතය පරිදි එකී මුද්‍රාව පාවිච්චි කිරීමේ, වෙනස් කිරීමේ, අමුතු කිරීමේ, කැඞීමේ හා කලින් කල අලුත් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය ඔවුන් සතුව ඇත්තේ ය. තවද සියලු අධිකරණයන්හි දී හා සැම ආකාරයකම අපරාධ හා සිවිල් නඩුවල දී ඔවුන් විසින් එනමින් ම නඩු පැවරිය යුතු අතර ඔවුන්ට විරුද්ධ ව නඩු පවරනු ලැබීම ද එනමින් ම කරනු ලැබිය යුතුය. තවද සංස්ථාවකට ආනුෂංගික හෝ අදාළ සෙසු සියලුම කටයුතු කිරීමේ බලය ඔවුන් සතු වන්නේ ය.

**සංස්ථාවේ පරමාර්ථ.**

4. සංස්ථාව සංස්ථාපනය කිරීමේ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි වේනැයි මෙයින් ප්‍රකාශයට පමුණුවනු ලැබේ :—

(අ) තක්සේරු විද්‍යා අධ්‍යයනය නඟා සිටුවීම හා ඊට ධෛර්ය දීම ;

2—ඒ 14470—10,240 (75/06)

(ආ) නාගරික හා කෘෂිකාර්මික දේපළ කළමනාකාරිත්ව අධ්‍යයනය නඟා සිටුවීම හා ඊට ධෛර්‍ය දීම ;

(ඇ) තක්සේරුකරණයට අවශ්‍ය හා අදාළ නීති අංශ අධ්‍යයනය නඟා සිටුවීම හා ඊට ධෛර්‍ය දීම ;

(ඈ) තක්සේරු විද්‍යාවට අදාළ හෝ සම්බන්ධ දැනුම අත්කර ගැනීම, පතළ කිරීම හා හුවමාරු කිරීම පහත සඳහන් අයුරින් දියුණු කිරීම :—

(i) පත්‍රිකා ඉදිරිපත් කිරීම සඳහාත් ඒ පිළිබඳ සාකච්ඡා පැවැත්වීම සඳහාත් සාකච්ඡා මණ්ඩපයක් ඇති කිරීමෙන්,

(ii) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාමෙන්,

(iii) තක්සේරුකරණයෙහි නිරත ව සිටින තැනැත්තන්ට වැදගත් වූ කරුණු පළ කිරීමෙන් හා

(iv) වෙනත් උපක්‍රමවලින් ;

(ඉ) ආයතනයේ සාමාජිකත්වය සඳහා යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම හෝ පැවැත්වීමට විධිවිධාන සැලැස්වීම, ඒ විභාග සඳහා අධ්‍යයන පාඨමාලා සැපයීම හෝ අනුමත කිරීම හා එහි ලා කථිකාචාර්යවරුන් හා පරීක්ෂකවරුන් යෙදවීම සහ ඔවුන්ගේ වේතන ගෙවීම ;

(ඊ) ආයතනය විසින් සපයන ලද හෝ අනුමත කරන ලද අධ්‍යයන පාඨමාලා හදාරා ආයතනයේ පරීක්ෂණවලින් සාමාර්ථය ලත් තැනැත්තන්ට ඩිප්ලෝමා, සහතික පත්‍ර සහ වෙනත් විශිෂ්ඨතා ප්‍රදානය කිරීම ;

(උ) ශිෂ්‍යත්ව, අනුශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර, පදක්කම් සහ වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම ;

(ඌ) විවිධ ශ්‍රේණිවල සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගැනීම සඳහා අපේක්ෂකයන්ගේ යෝග්‍යතා සොයා බැලීම ;

(එ) වෘත්තිය පිළිබඳ උසස් තත්ත්වයක් පවත්වාගෙන යාම පිණිස, තක්සේරුකරුවන් ලෙස වෘත්තියෙහි යෙදී සිටින තැනැත්තන්ගේ සාමාන්‍ය පැවැත්ම හා වෘත්තිය කටයුතු විධිමත් කිරීම ;

(ඒ) ශ්‍රී ලංකාවේ තක්සේරුකාර වෘත්තියෙහි හා ඒ වෘත්තිය සම්බන්ධයෙන් මහජනයාගේ ද යහපත, ශුභ සාධනය, අයිතිවාසිකම් හා වරප්‍රසාද සාමාන්‍යයෙන් ආරක්ෂා කිරීම හා නඟා සිටුවීම ;

(ඔ) තක්සේරුකාර වෘත්තියට බලපාන නෛතික හා වෙනත් කරුණු සම්බන්ධයෙන් ආයතනයේ සාමාජිකයන්ගේ මතය ප්‍රකාශ කිරීම ;

(ඕ) ශ්‍රී ලංකාව තුළ හෝ එයින් පිටස්තර ව සම ස්වභාවයක ස්වාර්ථ හා කාර්ය පැවරුණු සංවිධාන හා ශ්‍රී ලංකාවේ වෘත්තිය සංවිධාන සමඟ පොදු ස්වාර්ථ ආශ්‍රය කොට ගත් කරුණු සම්බන්ධයෙන් සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ක) තක්සේරු කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් රජයේ බලධරයන්ට උපදෙස් දීම හා ඔවුන් සමග අදහස් හුවමාරු කර ගැනීම ;

(ග) ආයතනය වෙත යොමු කරනු ලබන තක්සේරු කිරීම සම්බන්ධයෙන් වූ ආරාවුල් කිසිවක් නිශ්චය කිරීම පිණිස බේරුම්කාර කටයුතු භාර ගැනීම ; සහ

(ච) තොරතුරු බැංකු පිහිටුවීම සහ පවත්වාගෙන යාම ද ඇතුළුව, ශ්‍රී ලංකාව තුළ තක්සේරුකරණයෙහි යෙදී සිටින්නන්ගේ ප්‍රතිලාභය සහ ප්‍රගතිය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් පිළිවෙත් යෙදීම.

5. පහත සඳහන් බලතල සියල්ල හෝ එයින් කිසිවක් සංස්ථාව විසින් ක්‍රියාත්මක කළ හැකිය :— සංස්ථාවේ බලතල.

(අ) චංචල හෝ නිශ්චල දේපළ මිලට ගැනීම, ත්‍යාග, රික්ථවරණය හෝ හුවමාරු කිරීම මගින් හෝ වෙන යම් ආකාරයකින් අත්කර ගැනීම හා දැරීම ; ආයතනය විසින් එසේ අත්කර ගනු ලබන හෝ දරනු ලබන යම් දේපළක් බද්දට හෝ උකසට ගැනීම හෝ දීම, විකිණීම, ප්‍රදානය කිරීම, හුවමාරු කිරීම හෝ අන් ලෙසකින් බැහැර කිරීම ;

(ආ) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය යම් දෙයක් ගොඩ නැගීම, මිලට ගැනීම, පවත්වාගෙන යාම හා අලුත්වැඩියා කිරීම ;

(ඇ) ආයතනයේ කාර්ය කිසිවක් සඳහා ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ සපයා ගැනීම ;

(ඈ) ආයතනයේ කටයුතු කර ගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් හා සේවකයන් සේවයෙහි යෙදවීම හා ඔවුන්ට වැටුප්, පාරිතෝෂික හා දීමනා ගෙවීම ;

(ඉ) ආයතනයේ නිලධරයන් හා සේවකයන් විශ්‍රාම ගත් කල්හි ඒ නිලධරයන්ට හා සේවකයන්ටත් ඔවුන්ගේ වැන්දඹුවන්ට හා අනාථ දරුවන්ටත් දීමනා, පාරිතෝෂික හා කරුණාසහගත ගෙවීම් ගෙවීම ;

(ඊ) සංස්ථාගත සාමාජිකයන්ගේත් නිර්වේතන සාමාජිකයන්ගේත් වැන්දඹුවන්ට හා අනාථ දරුවන්ට මුදලින් ආධාර දීම සඳහා අරමුදලක් පිහිටුවීම ;

(උ) බෙලහීන වූ සංස්ථාගත සාමාජිකයන්ට හා නිර්වේතන සාමාජිකයන්ට මුදලින් ආධාර දීම සඳහා අරමුදලක් පිහිටුවීම ;

(ඌ) යම් කිසි ශ්‍රේණියක සාමාජිකත්වයට ඇතුළත් කිරීම සඳහාත් ඒ සාමාජිකත්වය අලුත් කිරීම සඳහාත් ගාස්තු අය කිරීම ;

(එ) යෝග්‍යතා පරීක්ෂණවලට හා ආයතනය මගින් සැපයෙන පාඨමාලාවලට තැනැත්තන් ඇතුළත් කිරීම සඳහා ගාස්තු අය කිරීම ;

(ඒ) ආයතනයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම, එහි සේවකයන්ගේ පාරිශ්‍රමික ගෙවීම, එහි බලතල පාවිච්චි කිරීම හා යුතුකම් ඉටු කිරීම යන මෙහි ලා දරන්නට සිදුවන වියදම් සියල්ල පියවීම පිණිස එහි මුදල් යෙදවීම ;

(ඔ) ආයතනයේ මුදල්වලින් ආයතනීය කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන මුදල් සංස්ථාව විසින් යෝග්‍ය යයි සැලකිය හැකි සුරැකුම්පත් කිසිවක යෝග්‍ය යයි සැලකෙන ආකාරයකින් ආයෝජනය කිරීම ; හා

(ඕ) ආයතනයේ පරමාර්ථ සියල්ල හෝ එයින් කිසිවක් මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය විය හැකි සියලුම කටයුතු කිරීම.

**සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.**

6. සංස්ථාවේ මුද්‍රාව සභාව භාරයේ සුරක්ෂිත ව තබා ගත යුතු අතර සභාවේ අවසරය කලින් ලැබගෙන සභාපති සහ ගරු මහ ලේකම් නැතහොත් සභාව විසින් නියම කළ හැකි සභාවේ වෙනත් සාමාජිකයකු ඉදිරියේ මිස එය කවරාකාර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතුය. ඔවුන් දෙදෙනා විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් තම අත්සන් සාධන පත්‍රයට තැබිය යුතුය. ඒ අත්සන් තැබීම යම් තැනැත්තකු සාක්ෂිකරුවකු ලෙස අත්සන් තැබීමෙන් පිටස්තර ව විය යුතුය.

**ආයතනයේ සාමාජිකත්වය ඉල්ලුම් කිරීම සහ ගාස්තුව.**

7. ආයතනයේ සාමාජිකයකු ලෙස බඳවා ගැනීම සඳහා වූ සෑම ඉල්ලුම් කිරීමක් හා ඒ සඳහා වූ ගාස්තුව මෙහි 'අ' උපලේඛනයෙහි දැක්වෙන විධිවිධාන අනුව විය යුතුය.

**ආයතනයේ සභාව.**

8. (1) 17 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට හෝ නියෝගවලට යටත්ව, ආයතනයේ කටයුතු පරිපාලනය කරන්නා වූ ද මේ පනත යටතේ ආයතනයේ බලතල පාවිච්චි කිරීමේ, කාර්ය කිරීමේ හා යුතුකම් ඉටු කිරීමේ වගකීම දරන්නා වූ ද සභාවක් මෙම ආයතනය සඳහා තිබිය යුතුය ; එය මේ පනතේ 'සභාව' යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේය :—

(අ) ආයතනයේ සංස්ථාගත සාමාජිකයන් විසින් එහි සභාවාරයක දී ඡන්දයෙන් තෝරා පත් කර ගත යුතු සභාපති, උප සභාපතිවරුන් දෙදෙනකු, ගරු මහ ලේකම්, ගරු සහකාර මහ ලේකම්වරයකු හා ගරු මහා භාණ්ඩාගාරිකවරයකු ;

(ආ) පහත සඳහන්, එනම් පණ්ඩිතගණ, උපාධිධාරී, ආශ්‍රිත හා අධිකාරලාභී යන එක් එක් සංස්ථාගත සාමාජික ශ්‍රේණියෙන් තෝරාගත් දෙදෙනකු ;

(ඇ) අමාත්‍යවරයා විසින් පත් කරන ලද සංස්ථාගත සාමාජිකයන් දෙදෙනකු ;

(ඈ) ප්‍රධාන තක්සේරුකරු ලෙස තත්කාලයෙහි නිල දරන තැනැත්තා ;

(ඉ) කොළඹ මහ නගර සභාවේ මහා නාගරික තක්සේරුකරු ලෙස තත්කාලයෙහි නිල දරන තැනැත්තා ;

(ඊ) අන්තිමට සභාපති ධුරය දැරූ තැනැත්තා :

එසේ වුව ද, ප්‍රථම සභාව සම්බන්ධයෙහි ලා මේ උපවගන්තියෙහි (අ) සහ (ආ) ඡේදවල නිශ්චිත සභාවේ සභාපති සහ සෙසු සාමාජිකයන් අමාත්‍යවරයා විසින් පත් කළ යුතු අතර කලින් ඉවත් කරනු නොලැබුවහොත්, ඔවුන් පත්වීම් ලැබූ කාල සීමාව ඉක්ම යන තෙක් ධූරය දැරිය යුතුය. අමාත්‍යවරයා විසින් එසේ පත් කරනු පිණිස, මෙහි ‘අ’ උපලේඛනයෙහි 1(1) (අ) වන ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් නියම කරන ලද දිනය ඉකුත්වීමෙන් පසු හැකි තාක් ඉක්මනින්, බඳවා ගැනීමේ නිලධරයා විසින් විවිධ සංස්ථාගත සාමාජික ශ්‍රේණිවලට බඳවා ගනු ලැබූ තැනැත්තන්ගේ නාමාවලියක් අමාත්‍යවරයා වෙත සැපයිය යුතුය.

**සභාවේ සාමාජිකයන්ගේ ධූර කාලය.**

9. (1) සභාවේ සෑම සාමාජිකයකු ම කලින් තම ධූරය හිස් නො කළහොත් හෝ අමාත්‍යවරයා විසින් ඉවත් නො කළහොත්—

(අ) ඔහු සභාවට තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයකු නම්, 18 වන වගන්තිය යටතේ අලුත් සාමාජිකයන් තෝරා පත් කර ගනු ලබන තෙක් ;

(ආ) ඔහු 8 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයකු නම්, ඔහු වෙනුවට අමාත්‍යවරයා විසින් වෙනත් සාමාජිකයකු පත් කරනු ලබන තෙක්,

ධූර දැරිය යුතුය.

(2) 8 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) සහ (ඉ) ඡේදවල සඳහන් සාමාජිකයන් හැර සභාවේ සෙසු සියලුම සාමාජිකයන් පහත දැක්වෙන පරිදි ධූර අත්හළ යුතුය:—

(අ) සභාව වෙත යවනු ලබන ලිපියක් මගින් ධූරයෙන් ඉල්ලා අස්වීමෙන් ; සභාව විසින් ඒ ඉල්ලා අස්වීම භාරගත් බව ඒ සාමාජිකයා වෙත දන්වන තුරු ඒ ඉල්ලා අස්වීම ක්‍රියාත්මක නොවන්නේය ; නැතහොත්

(ආ) සභාවේ අවසර නොමැතිව පිට පිට ම සභා රැස්වීම් තුනකට නොපැමිණි විට ; නැතහොත්

(ඇ) ආයතනයේ සාමාජිකත්වය නැති වූ විට ; නැතහොත්

(ඈ) ධූර කාලය ඉකුත් වූ විට ; නැතහොත්

(ඉ) ඔහු පත් කරන ලද්දේ අමාත්‍යවරයා විසින් නම්, අමාත්‍යවරයා විසින් ඔහු අස් කරනු ලැබූ විට.

(3) තම ධූර කාලය ඉකුත් වීමට පෙර සභාවේ සාමාජිකත්වය නැති වූ සාමාජිකයකු වෙනුවට පත් කරනු ලැබූ සභාවේ සෑම සාමාජිකයකු ම කලින් ඉල්ලා අස් නොවුවහොත්, මිය නොගියහොත් හෝ අන් ලෙසකින් ධූරය අත්හැර නොගියහොත්, ඔහු අනුප්‍රාප්ත වන් සාමාජිකයාගේ ධූර කාලයෙන් ශේෂව ඇති කාල සීමාව තුළ ධූරය දැරිය යුතුය.

(4) 11 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කාලය ඉකුත්වීමෙන් ධුරය අත්හරින සභාවේ සෑම සාමාජිකයා ම සාමාජිකයකු ලෙස නැවත පත් කිරීමට හෝ නැවත තෝරා ගැනීමට හෝ සුදුසු වන්නේ ය.

සභාවේ රැස්වීම්.

10. (1) සභාවේ රැස්වීම් යටත් පිරිසෙයින් මාස තුනකට වරක් වත් පැවැත්විය යුතුය.

(2) සභාවේ රැස්වීම්වල ගණපූරණය සඳහා සභාවේ සාමාජිකයන් දස දෙනකු පැමිණ සිටිය යුතුය.

(3) සභාවේ රැස්වීමක දී සභාවේ සභාපති විසින් හෝ ඔහු නො පැමිණි විටක උප සභාපති විසින් හෝ ඒ දෙදෙනාම නොපැමිණි විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා ගනු ලබන සාමාජිකයකු විසින් හෝ මූලසුන දැරිය යුතුය.

(4) සභාවේ රැස්වීම් කැඳවීම, සභාපති විසින්, සිය කැමැත්තෙන්ම හෝ සභාවේ සාමාජිකයන් පස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් ඒ සඳහා ලිඛිත අධියාචනයක් කරනු ලැබූ විටක හෝ කළ යුතුය.

(5) සභාවේ සෑම රැස්වීමක් ම පැවැත්වෙන වේලාව හා ස්ථානයත් සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වැඩ කටයුතුත් නිශ්චය කොට දැක්වෙන ලිඛිත නිවේදනයක් සම්පූර්ණ දින හතකට කලින් එක් එක් සාමාජිකයා වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් ලැබෙන ලෙස ඒ ඒ සාමාජිකයා අන්තිමට පදිංචිව සිටියේ යැයි දන්නා ස්ථානය වෙත යැවිය යුතුය.

(6) සභාවේ යම් රැස්වීමක දී, තත්කාලයෙහි මූලසුන දරන තැනැත්තා විසින්, පැමිණ සිටින සාමාජිකයන්ගෙන්, බහුතරයක කැමැත්ත ඇතිව, ඒ රැස්වීම අඩාලව කල් තැබිය හැකිය.

(7) (8) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සභාවේ යම් රැස්වීමක දී උද්ගත වන යම් ප්‍රශ්නයක් තීරණය කිරීම පැමිණ සිටින සාමාජිකයන්ගෙන් බහුතරයක් විසින් කළ යුතු අතර, සම ඡන්දයක් ඇති වූ විටක, සභාවේ මූලසුන දරන සාමාජිකයාට ද්විතීය නොහොත් තීරක ඡන්දයක් ඇත්තේ ය.

(8) ආයතනයේ සාමාජිකයකුගේ නම නාම ලේඛනයෙන් ඉවත් කිරීම හෝ අත්හිටුවීම සභාවේ ධුර දරන මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් සභාවේ රැස්වීමක දී සම්මත කෙරෙන යෝජනාවක් මගින් මිස නොකළ යුතුය.

(9) සභාව විසින් එහි සෑම රැස්වීමක ම කටයුතු පිළිබඳ වාර්තා තත් කාර්යය සඳහා තබා ඇති පොත්වල ලිවීමට සැලැස්විය යුතු අතර ඒ කටයුතු පිළිබඳ වාර්තා ඊළඟ සභා රැස්වීමෙහිදී මූලසුන දරන සාමාජිකයා විසින් අත්සන් කළ යුතුය. තවද එසේ අත්සන් කරන ලද වාර්තා මුල් බැල්මට ඒ වාර්තාවල දැක්වෙන කරුණුවලට සාක්ෂි වන්නේ ය.

(10) හුදෙක් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහි දී වූ යම් දෝෂයක් තිබීම හෝ හේතුකොට ගෙන සභාවේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවන්නේ ය.

සභාවේ නිලධරයන් යනාදීන් ලෙස තෝරා ගැනීම සඳහා සුදුසුකම්.

**11.** (1) සභාවේ පහත දැක්වෙන යම් ධුරයකට තෝරා ගැනීම සඳහා ඒ ධුරය සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් අවශ්‍ය සුදුසුකම් නොමැති කිසිම තැනැත්තෙක් සුදුසු නොවන්නේය :—

(අ) සභාපති හෝ උපසභාපති, සංස්ථාගත වූ ද පණ්ඩිත ගණ ශ්‍රේණියෙහි වූ ද සාමාජිකයකු ලෙස නාම ලේඛනගත කර තිබීම ; හෝ

(ආ) ගරු මහ ලේකම් හෝ ගරු මහා භාණ්ඩාගාරික, උපාධිධාරී සාමාජිකයකුගේ ශ්‍රේණියට වඩා පහත් නොවූ යම් ශ්‍රේණියක සංස්ථාගත සාමාජිකයකු ලෙස නාම ලේඛන ගත කර තිබීම ; හෝ

(ඇ) ගරු සහකාර මහ ලේකම්, ආශ්‍රිත සාමාජිකයකුගේ ශ්‍රේණියට වඩා පහත් නොවූ යම් ශ්‍රේණියක සංස්ථාගත සාමාජිකයකු ලෙස නාම ලේඛනගත කර තිබීම ;

(ඈ) සභාවේ සංස්ථාගත සාමාජිකත්වය ලත් යම් ශ්‍රේණියක් නියෝජනය කරන සාමාජිකයකු, එම ශ්‍රේණියෙහි නාම ලේඛනගත කර තිබීම.

(2) සභාවේ සාමාජිකයකු ලෙස පිට පිට ම ධුර කාල තුනක් ධුර දැරූ යම් තැනැත්තකු ධුර දැරීම නතරවූ දින සිට දැවුරුද්දක් ගත වන තුරු නැවත තෝරා ගැනීම සඳහා ඒ තැනැත්තා සුදුසු නොවන්නේය.

සභාවට නිලධරයන් යනාදීන් තෝරා ගැනීමේ කාර්ය පටිපාටිය.

**12.** (1) සභාවේ යම් ධුරයකට තෝරා පත් කර ගැනීම සඳහා අපේක්ෂකයකු ලෙස යම් තැනැත්තකු නම් කිරීම කළ යුත්තේ පිළිවෙළින් යෝජනාකරු හා ස්ථිරකරු විය යුතු සංස්ථාගත සාමාජිකයන් දෙදෙනකු විසින් ඒ අපේක්ෂකයා තෝරා පත් කර ගත යුතු යැයි නිර්දේශ කරනු ලබන බව සහතික කරමින් ඒ සාමාජිකයන් දෙදෙනා විසින් අත්සන් කරනු ලබන්නා වූ නාම යෝජනා පත්‍රයක් මගිනි :

එසේ වුව ද සංස්ථාගත සාමාජිකයන්ගේ යම් ශ්‍රේණියක් නියෝජනය කරන සාමාජිකයකු ලෙස තෝරා පත් කර ගනු ලැබීමට බලාපොරොත්තු වන සාමාජිකයකු සම්බන්ධයෙන් නම්, ඒ අපේක්ෂකයාගේ යෝජනාකරු හා ස්ථිරකරු එම ශ්‍රේණියෙහි නාම ලේඛන ගත කරන ලද සංස්ථාගත සාමාජිකයන් දෙදෙනකු විය යුතුය.

(2) ඒ සෑම නාම යෝජනා පත්‍රයක් ම අපේක්ෂකයා විසින් අත්සන් කළ යුතු අතර තත් කාර්යය සඳහා සභාව විසින් සපයනු ලබන ආකෘතියක් අනුව විය යුතුය.

(3) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන අනුව පිළියෙළ කරන ලද නාම යෝජනා පත්‍රය යටත් පිරිසෙයින් රැස්වීම සඳහා නියමිත දිනයට සති හතරකට වත් පෙර ගරු මහ ලේකම් වෙත භාර දිය යුතුය.

(4) සභාවේ සාමාජිකයකු වශයෙන් තෝරා පත් කර ගැනීම සඳහා අපේක්ෂකයකු ලෙස නම් කරනු ලැබූ තැනැත්තකු නාම යෝජනා කරනු ලැබීමට නුසුදුස්සකු බව පෙනී ගිය හොත් එසේ ඔහු නාම යෝජනා කරනු ලැබ සිටීම නතර වන්නේය.

(5) එක් අපේක්‍ෂකයකුට වැඩි සංඛ්‍යාවක් තෝරා පත් කර ගැනීම සඳහා නාම යෝජනා කරනු ලැබූ අවස්ථාවක ඒ තෝරා පත් කර ගැනීම රහස් ඡන්දයෙන් කළ යුතුය.

(6) තෝරා පත් කර ගැනීම සඳහා අපේක්ෂකයන් නොවූ සංස්ථාගත සාමාජිකයන් අතුරින් සභාව විසින් පත් කෙරෙන සාමාජිකයන් දෙදෙනකු විසින් ඡන්ද ගණන් කළ යුතුය.

(7) යම් සභා වාරයක දී සභාවේ යම් ධුරයකට තෝරා ගැනීම සඳහා කිසිම සාමාජිකයකු විධිමත් ලෙස නාම යෝජනා ලැබ නොසිටිය හොත්, පටහැනිව මේ පනතෙහි කුමක් සඳහන් වුවද එය නොතකා, ඊළඟ සභාවාරයෙහි දී අනුප්‍රාප්තිකයකු පත් කරනු ලබන තෙක්, තත්කාලයෙහි එම ධුරය දරන්නා ම එම ධුරය දැරිය යුතුය.

(8) සාමාජිකත්වය පිළිබඳ අයිතිවාසිකම් හා වරප්‍රසාද ලැබීමට සුදුසුකම් ඇති මුළු සංස්ථාගත සාමාජික සංඛ්‍යාවෙන් යටත්පිරිසෙයින් පහෙන් දෙකක්වත් නොපැමිණ සිටියහොත් සභාවාරයක දී සභාවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම නොකළ යුතුය. පැමිණ සිටින සාමාජික සංඛ්‍යාව අවශ්‍ය සංඛ්‍යාවට වඩා අඩු වුවහොත්, තත්කාලයෙහි සභාවට තෝරා පත් කර ගනු ලැබ සිටින සාමාජිකයන්, පටහැනිව මේ පනතෙහි කුමක් සඳහන් වුව ද එය නොතකා, ඊළඟ සභා වාරයෙහි දී තම අනුප්‍රාප්තිකයන් තෝරා පත් කර ගනු ලබන තෙක්, ධුර දැරිය යුතුය.

සභාපති.

**13.** සභාවේ සභාපති ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා වන්නේය. සභාවේ සහ ආයතනයේ සියලුම රැස්වීම්වල දී ඔහු මූලාසනය දැරිය යුතුය. ඔහු විසින් තම කාර්ය හා යුතුකම් කිසිවක් උපසභාපතිවරයකු වෙත පවරා දිය හැකිය.

ගරු මහ ලේකම්.

**14.** සභාව සහ ආයතනය වෙනුවෙන් සියලුම ලියුම් ගනුදෙනු කිරීම, සභාවේ සහ ආයතනයේ සියලුම රැස්වීම්වල වාර්තා තබා ගැනීම, සභාවේ සහ ආයතනයේ රැස්වීම් පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම, සභාවේ සහ ආයතනයේ වාර්ෂික වාර්තා පිළියෙළ කිරීම, සභාවේ සහ ආයතනයේ සාමාජික ලේඛනය පවත්වාගෙන යාම සහ සභාව විසින් තමන් වෙත පවරා දිය හැකි අන් සියලුම යුතුකම් ඉටු කිරීම ගරු මහ ලේකම් විසින් කළ යුතුය.

ගරු මහා භාණ්ඩාගාරික.

**15.** ආයතනයට ලැබිය යුතු මුදල් එකතු කිරීම, ආයතනයේ මුදල් පිළිබඳ ගිණුම් යථා ලෙස තබා ගැනීම, ආයතනයේ මුදල් තත්ත්වය පිළිබඳ මාසික ප්‍රකාශයක් පිළියෙළ කොට සභාව වෙත ඉදිරිපත් කිරීම, ආයතනයේ ගිණුම් පිළිබඳ වාර්ෂික ප්‍රකාශයක් පිළියෙළ කිරීම හා ආයතනයේ මුදල් කටයුතු සම්බන්ධයෙන් සභාව විසින් තමන් වෙත පවරා දිය හැකි වෙනත් යුතුකම් ඉටු කිරීම ගරු මහා භාණ්ඩාගාරික සතු වගකීම වන්නේය.

සභාවේ කමිටු.

**16.** (1) සභාව විසින් තීරණය කළ හැකි යම් කාර්යයක් සඳහා සභාව විසින් කලින් කල කමිටු පත්කළ හැකි අතර ඒ එක් එක් කමිටුව සතු යුතුකම් හා කාර්ය එය වෙත පැවරිය යුතුය.

(2) ඒ සෑම කමිටුවකට ම යටත්පිරිසෙයින් සභාවේ එක් සාමාජිකයකු වත් ඇතුළත් විය යුතුය.

(3) සෑම කමිටුවක ම සභාපති සභාවේ සාමාජිකයකු විය යුතුය.

(4) සභාවේ සාමාජිකයන් එක් කෙනකුට වැඩි සංඛ්‍යාවක් කමිටුවට පත් කරනු ලැබුවහොත්, එහි සභාපති සභාව විසින් පත් කළ යුතුය.

(5) කමිටුවේ සෑම රැස්වීමක දී ම සභාපති මුලසුන දැරිය යුතු අතර ඔහු නොපැමිණි විටක, පැමිණ සිටින සාමාජිකයන්ගෙන් බහුතරයක් විසින් තෝරා ගනු ලබන සාමාජිකයකු ඒ රැස්වීමේ දී මුලසුන දැරිය යුතුය.

(6) සභාව විසින් දිය හැකි යම් විධානයකට යටත් ව, කමිටුව විසින් තම කාර්ය පරිපාටිය විධිමත් කොට තම කටයුතු කිරීම සුදුසු යැයි සිතන ආකාරයකින් කළ හැකිය.

රීති හෝ නියෝග සෑදීමට අමාත්‍යවරයාට ඇති බලය.

17. (1) සභාව සංස්ථාපනය කරනු ලබන තෙක් තමාගේ ම මුලිකත්වය පිට හා ඉන්පසු සභාවේ ඉල්ලීම පිට පහත සඳහන් කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති හෝ නියෝග සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) නියම කිරීමට නියමිත යම් කරුණක් හෝ, රීති හෝ නියෝග සෑදීමට බලය පැවරී ඇති නොහොත් නියමිත යම් කරුණක් ;

(ආ) (i) සාමාජිකයන් සංස්ථාගත සහ සංස්ථාගත නොවූ සාමාජිකයන් ලෙස වර්ගීකරණය ;

(ii) සංස්ථාගත සහ සංස්ථාගත නොවූ සාමාජිකයන් ශ්‍රේණිගත කිරීම ;

(ඇ) සාමාජිකත්වයට ඇතුළු කිරීම හෝ සාමාජිකත්වය අලුත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු හා ඒ ගාස්තු ගෙවිය යුතු කාලය සහ ආකාරය ;

(ඈ) ආයතනයේ සහ සභාවේ රැස්වීම්, ඒ රැස්වීම් කැඳවිය යුතු ආකාරය සහ කාලය හා ඒ රැස්වීම්වල කටයුතු කිරීම ;

(ඉ) සභාවට සාමාජිකයන් තෝරා පත්කර ගැනීම හෝ පත් කිරීම ;

(ඊ) සභාවේ නිලධරයන්ගේ බලතල, කාර්ය හා යුතුකම් ;

(උ) සභාවේ කමිටු සංස්ථාපනය කිරීම, ඒ කමිටුවලට සාමාජිකයන් තෝරා පත් කර ගැනීම හෝ නම් කිරීම, ඒ කමිටුවල බලතල, කාර්ය හා යුතුකම්, හා ඒ බලතල, කාර්ය හා යුතුකම් පාවිච්චි කිරීමේ හෝ ඉටු කිරීමේ කොන්දේසි ;

(ඌ) ආයතනයට නිලධරයන් පත් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමික, ඔවුන් සේවයෙන් පහ කිරීම හා ඔවුන්ගේ විනය පාලනය හා ඔවුන් විශ්‍රාම ගත් විට ඔවුන්ට හෝ මියගිය විට ඔවුන්ගේ වැන්දඹුවන්ට හා අනාථ දරුවන්ට හෝ දීමනා, පාරිතෝෂික සහ කරුණාසහගත ගෙවීම් ලබාදීම ;

(එ) ආයතනයේ යෝග්‍යතා පරීක්ෂණයට ඇතුළත් කිරීම සඳහාත් ආයතනය විසින් සපයනු ලබන පාඨමාලා සඳහාත් ශිෂ්‍යයන් විසින් ගෙවිය යුතු ගාස්තු ;

(ඒ) කථිකාචාර්යවරයන්ටත් පරීක්ෂකයන්ටත් පාරිශ්‍රමික ගෙවීම ;

(ඔ) සංස්ථාගත හා සංස්ථාගත නොවූ සාමාජිකයන්ගේ වැන්දඹුවන්ට හා අනාථ දරුවන්ට මුදලින් ආධාරදීම සඳහා අරමුදලක් පිහිටුවීම හා එය විධිමත් කිරීම;

(ඕ) ආයතනය සතු දේපළ පරිපාලනය කිරීම හා ඒ පිළිබඳ කළමනාකාරිත්වය;

(ක) ආයතනය වෙත ලැබෙන සියලුම මුදල් බැර කළ යුතු වූ ද සභාව විසින් තම බලතල පාවිච්චි කිරීමේ දී, කාර්ය කිරීමේ දී හෝ යුතුකම් ඉටු කිරීමේ දී දරනු ලබන සියලුම වියදම් හා බැඳීම් හර කළ යුතු වූ ද අරමුදලක් පිහිටුවා පවත්වාගෙන යාම;

(ග) ආයතනය විසින් තබා ගත යුතු ගිණුම් පොත්;

(ච) ආයතනයේ ගිණුම් විගණනය කිරීම;

(ජ) ආයතනයේ මුදල් ආයෝජනය කළ හැකි ආකාරය;

(ට) තීරණයක් කිරීම සඳහා ආයතනය වෙත යොමු කෙරෙන ආරාවුල් බේරුම් කිරීම; හා

(ඩ) මේ පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහාත් ආයතනයේ බලතල පාවිච්චි කිරීම හා එහි යුතුකම් ඉටු කිරීම සඳහාත් අවශ්‍ය විය හැකි, මෙහි මින් පෙර නිශ්චිත ලෙස සඳහන් නොකරන ලද අන් සියලුම කරුණු.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම හෝ නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එසේ පළ කරනු ලබන දිනයෙහි එය ක්‍රියාත්මක වන්නේය. එවැනි සෑම රීතියක් ම හෝ නියෝගයක් ම, එය එසේ පළ කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මණින්, අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ රීතිය හෝ නියෝගය එසේ අනුමත කරනු නොලැබුවහොත් ඒ අනනුමතියේ දින සිට එය පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු නමුත් එම රීතිය හෝ නියෝගය යටතේ කරනු ලැබූ කිසිවකට ඉන් හානියක් නොවන්නේය. තවද එම අනනුමතිය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

ආයතනයේ සභා වාර.

18. (1) සෑම අවුරුදු දෙකකට ම වරක් ආයතනයේ සභා වාරයක් පැවැත්විය යුතුය.

(2) ආයතනයේ සභා වාරයක් සඳහා අවශ්‍ය ගණපූරණය ඒ සභා වාරයේ දී ඡන්දය දීමට සුදුසුකම් ඇති ආයතනයේ සංස්ථාගත සාමාජිකයන්ගෙන් පහෙන් දෙකක් වන්නේය.

(3) ඒ සභා වාරයේ දී—

(අ) පෙරාතුව වූ මුදල් අවුරුද්ද වෙනුවෙන් සභාවේ වාර්තාව හා විගණනය කරන ලද ගිණුම් ඉදිරිපත් කළ යුතුය,

(ආ) සභාවේ සාමාජිකයන් තෝරා පත් කළ යුතුය, තවද

(ඇ) සභාව විසින් තීරණය කරනු ලබන්නා වූ ද (4) වන උපවගන්තිය යටතේ දෙන ලද දැන්වීමෙහි සඳහන් වන්නා වූ ද වෙන යම් කටයුත්තක් කළ හැකිය.

(4) සභා වාරයක් පිළිබඳ දැන්වීම දෙමසකට නොඅඩු කලකට පෙර එක් එක් සංස්ථාගත සාමාජිකයා වෙත ලිඛිත ව යැවිය යුතුය. සභා වාරය සඳහා නියමිත දිනය, වේලාව සහ ස්ථානයත් එහි දී සලකා බැලිය යුතු කටයුතු ඛණ්ඩ වශයෙනුත් ඒ දැන්වීමෙහි සඳහන් විය යුතු අතර ඒ සාමාජිකයා අන්තිමට පදිංචිව සිටියේ යැයි දැන සිටි ස්ථානයේ ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එය යැවිය යුතුය.

(5) සභා වාරයක් පිළිබඳ දැන්වීම ශ්‍රී ලංකාව තුළ ප්‍රචාරය කෙරෙන දෛනික ප්‍රවෘත්ති පත්‍රයක යටත්පිරිසෙයින් දෙසතියකට වත් කලින් පළ කළ යුතුය.

19. (1) ප්‍රථම සභාව සංස්ථාපනය කිරීමෙන් පසු අවුරුද්දක් ගතවීමට පෙර සංස්ථාගත සාමාජිකයන්ගේ ප්‍රථම සාකච්ඡා වාරය පැවැත්විය යුතුය. ඉන් ඉක්බිති ව, යටත්පිරිසෙයින් අවුරුදු දෙකකට වරක් වත් සාකච්ඡා වාරයක් පැවැත්විය යුතුය. ආයතනයේ ප්‍රථම සාකච්ඡා වාරය.

(2) ආයතනයේ සෑම සාකච්ඡා වාරයක් පිළිබඳ ව ම සම්පූර්ණ දින දහහතරකට කලින් ලිඛිත දැන්වීමක් සාමාජිකයන් වෙත යැවිය යුතුය. ඒ සාකච්ඡා වාරය පැවැත්වෙන වේලාව හා ස්ථානයත් එය හමුවෙහි තැබිය යුතු කටයුතුත් ඒ දැන්වීමෙහි නිශ්චය කොට දැක්විය යුතුය.

(3) ඒ දැන්වීම, එක් එක් සාමාජිකයා අන්තිමට පදිංචිව සිටියේ යැයි දැන සිටි ස්ථානයේ ලිපිනයට ඒ ඒ සාමාජිකයා වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය.

(4) ආයතනයේ යම් සාකච්ඡා වාරයක ගණපූරණය සඳහා ආයතනයේ සංස්ථාගත සාමාජිකයන්ගෙන් හතරෙන් එකක් පැමිණ සිටිය යුතුය.

20. (1) සංස්ථාගත සාමාජිකයන්ගේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට සැලැස්වීම සභාවේ සභාපති විසින් තමාගේ ම ඕනෑකම පිට කළ හැකි අතර සභාවේ සාමාජිකයන් පස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් හෝ ඡන්දය දීමට සුදුසුකම් ලත් ආයතනයේ සංස්ථාගත සාමාජිකයන් විසි පස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් කරනු ලබන විටක සංස්ථාගත සාමාජිකයන්ගේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට සැලැස්විය යුතුය. ආයතනයේ විශේෂ මහා සභා රැස්වීම්.

(2) සෑම විශේෂ මහා සභා රැස්වීමක් පිළිබඳ ව ම දැන්වීම යටත් පිරිසෙයින් සම්පූර්ණ දින දහහතරකට වත් පෙර එක් එක් සාමාජිකයා වෙත ලිඛිත ව යැවිය යුතුය. රැස්වීම සඳහා නියමිත දිනය, වේලාව සහ ස්ථානයත් කැඳවනු ලබන රැස්වීමෙහි දී සාකච්ඡා කළ යුතු කරුණුත් ඒ දැන්වීමෙහි සඳහන් විය යුතු අතර ඒ සාමාජිකයා අන්තිමට පදිංචි ව සිටියේ යැයි දැන සිටි ස්ථානයේ ලිපිනය අනුව ලියාපදිංචි කළ තැපෑලෙන් එය යැවිය යුතුය.

(3) රැස්වීමක් පිළිබඳ දැන්වීම ශ්‍රී ලංකාව තුළ ප්‍රචාරය කෙරෙන දෛනික ප්‍රවෘත්ති පත්‍රයක යටත්පිරිසෙයින් දෙසතියකට වත් කලින් පළ කළ යුතුය.

(4) (2) වන උපවගන්තිය යටතේ එක් එක් සාමාජිකයා වෙත නිකුත් කරනු ලබන දැන්වීමට සම්බන්ධ විශේෂ මහා සභා රැස්වීමේ දී ඒ දැන්වීමෙහි සඳහන් වූවක් හැර අන් කිසිම කරුණක් සලකා නොබැලිය යුතුය.

(5) යම් විශේෂ මහා සභා රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය ඡන්දය දීමට සුදුසුකම් ලත් සංස්ථාගත සාමාජිකයන්ගෙන් පහෙන් දෙකක් විය යුතුය.

ආයතනයේ සාමාන්‍ය මහා සභා රැස්වීම.

**21.** (1) වෘත්තියෙහි අවධානය යොමු විය යුතු කරුණු පිළිබඳ පත්‍රිකා කියවීම හා ඒ හා සම්බන්ධ සාකච්ඡා පැවැත්වීම සඳහා ආයතනයේ සංස්ථාගත සාමාජිකයන්ගේ සාමාන්‍ය මහා සභා රැස්වීමක් කැඳවිය හැකිය.

(2) කිසිම සාමාන්‍ය මහා සභා රැස්වීමක දී ආයතනයේ කටයුතු හෝ කළමනාකාරිත්වයට සම්බන්ධ වූ නැතහොත් සභාවේ කටයුතු වලට සම්බන්ධ වූ කිසිම කරුණක් සාකච්ඡා නොකළ යුතුය.

(3) සාමාන්‍ය මහා සභා රැස්වීමක් පිළිබඳ දැන්වීම යටත් පිරිසෙයින් සම්පූර්ණ දින හතකට වත් කලින් එක් එක් සංස්ථාගත සාමාජිකයා වෙත ලිඛිත ව යැවිය යුතුය.

(4) සාමාන්‍ය මහා සභා රැස්වීමක ගණපූරණය සඳහා ආයතනයේ සංස්ථාගත සාමාජිකයන් පසළොස් දෙනකු පැමිණ සිටිය යුතුය.

සභාවේ සාමාජිකයන් නාම ලේඛනයෙන් ඉවත් කිරීම හෝ ඔවුන්ගේ සාමාජිකත්වය අත්හිටුවීම.

**22.** (1) ආයතනයේ සාමාජිකයකු වූ යම් තැනැත්තකු—

(අ) දුරාචාරයට සම්බන්ධ වූ ද මාස හයකට නොඅඩු කාලයක් බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් ලැබිය යුතු වූ ද වරදකට ශ්‍රී ලංකාව තුළ හෝ එයින් පිටත හෝ නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ ඇතහොත් ; හෝ

(ආ) සිහිවිකල භාවයෙන් යුක්ත වූවෙකැයි ශ්‍රී ලංකාව තුළ හෝ එයින් පිටත හෝ නිසි බලය ඇති අධිකරණයක් විසින් තීරණය කරනු ලැබ ඇතහොත් ; හෝ

(ඇ) සභාව විසින් හෝ සභාවේ කමිටුවක් විසින් හෝ පවත්වනු ලබන පරීක්ෂණයකින් පසු වෘත්තීය විෂමාචාරයට වරද කරු බව තීරණය කරනු ලැබ ඇතහොත්,

ඔහු ලේඛනයෙන් ඉවත් කිරීමේ බලය සභාව සතුව ඇත්තේය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ හෝ විධිවිධාන අනුව ආයතනයේ සාමාජිකයකු වූ යම් තැනැත්තකු ලේඛනයෙන් ඉවත් කිරීමේ බලය සභාව වෙත පැවරෙන අවස්ථාවක, සභාව විසින් ඒ බලය පාවිච්චි කිරීම වෙනුවට සභාව විසින් යෝග්‍ය යැයි සලකනු ලබන කාල සීමාවක් ඒ තැනැත්තාගේ සාමාජිකත්වය අත්හිටුවිය හැකිය.

(3) සභාව විසින් යම් තැනැත්තකු ලේඛනයෙන් ඉවත් කරනු ලැබූ හෝ ඔහුගේ සාමාජිකත්වය අත්හිටුවනු ලැබූ හෝ අවස්ථාවක සභාව විසින් සභාවේ ම ඕනෑකම පිට හෝ ඒ තැනැත්තාගේ ඉල්ලීම පිට, ඒ තැනැත්තා තාක්ෂේරුකරුවකු ලෙස වෘත්තියෙහි නිරතවීමට සුදුසු යයි සභාව සෑහීමට පත් වුවහොත්, ඔහු නැවත නාම ලේඛන ගත කිරීම හෝ නැවත සාමාජිකත්වයෙහි පිහිටුවීම කළ හැකිය.

(4) මේ පනතේ කාර්යයන් සඳහා තත්කාලයෙහි මෙහි 'ආ' උපලේඛනයෙහි නිශ්චිය වශයෙන් දක්වා ඇති යම් ක්‍රියාවක් හෝ අකෘතයක් විෂමාචාරයක් වන්නේ ය.

නාම හා නිල නාම පාවිච්චි කිරීම.

23. (1) ආයතනයේ පණ්ඩිතගණ සාමාජිකයකු ලෙස ලියාපදිංචි වූ ආයතනයේ සෑම සාමාජිකයකුට ම තමා පණ්ඩිතගණ සාමාජිකයකු බව පෙන්වීම පිණිස තම නාමෙහි අගට "එෆ්.අයි.වී." යන කෙටි නිල නාමය යෙදීමේ අයිතිවාසිකම ඇත්තේ ය.

(2) ආයතනයේ උපාධිධාරී සාමාජිකයකු ලෙස ලියාපදිංචි වූ ආයතනයේ සෑම සාමාජිකයකුට ම තමා උපාධිධාරී සාමාජිකයකු බව පෙන්වීම පිණිස තම නාමෙහි අගට "ජී.එම්.අයි.වී." යන කෙටි නිල නාමය යෙදීමේ අයිතිවාසිකම ඇත්තේ ය.

(3) ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු ලෙස ලියාපදිංචි වූ ආයතනයේ සෑම සාමාජිකයකුට ම තමා ආශ්‍රිත සාමාජිකයකු බව පෙන්වීම පිණිස තම නාමෙහි අගට "ඒ.අයි.වී." යන කෙටි නිල නාමය යෙදීමේ අයිතිවාසිකම ඇත්තේ ය.

(4) ආයතනයේ අධිකාරලාභී සාමාජිකයකු ලෙස ලියාපදිංචි වූ ආයතනයේ සෑම සාමාජිකයකුට ම තමා අධිකාරලාභී සාමාජිකයකු බව පෙන්වීම පිණිස තම නාමෙහි අගට "එල්.අයි.වී." යන කෙටි නිල නාමය යෙදීමේ අයිතිවාසිකම ඇත්තේ ය.

(5) ඉහත දැක්වුණු උපවගන්ති යටතේ ලියාපදිංචි වූ සෑම සාමාජිකයකු ට ම "සංස්ථාගත තක්සේරුකරු" යන නාමය ගැනීමේ හා යෙදීමේ අයිතිවාසිකම ඇත්තේ ය.

නාම පාවිච්චි කිරීම පිළිබඳ සීමා.

24. (1) (අ) 23 වන වගන්තියේ සඳහන් වූ ද ඒ වගන්තිය යටතේ සංස්ථාගත සාමාජික පන්තියේ යම් ශ්‍රේණියකට බඳවා ගනු ලැබූ සාමාජිකයකු විසින් පමණක් ගෙන පාවිච්චි කළ හැකි වූ ද යම් නාමයක්, විස්තරයක් හෝ සංකේතාක්ෂරයක් කිසිම තැනැත්තකු විසින් ගැනීම හෝ පාවිච්චි කිරීම, තත්කාලයෙහි තමා සාමාජිකයකු ලෙස එම ශ්‍රේණියට බඳවා ගනු නොලැබ සිටියහොත්, නොකළ යුතුය.

(ආ) (අ) ඡේදයෙහි කුමක් සඳහන් වුව ද එය නොතකා, තක්සේරුකාර සමාගමක එක් එක් හවුල්කරු 23 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ "සංස්ථාගත තක්සේරුකරු" යන නාමය ගෙන පාවිච්චි කිරීමට හිමිකම් ලැබ ඇතහොත්, ඒ තක්සේරුකාර සමාගම විසින් "සංස්ථාගත තක්සේරුකරුවෝ" යන නාමය ගෙන පාවිච්චි කළ හැකිය.

(2) ඉහත දැක්වෙන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන්නේ ය.

"තක්සේරුකරුවකු ලෙස වෘත්තියෙහි යෙදීම" යන්නෙහි අර්ථය.

25. මේ පනතේ කාර්යයන් සඳහා යම් තැනැත්තකු තමන් විසින් ම හෝ වෙන යම් තැනැත්තකු සමග හවුලේ ලබාගන්නා ලද නැතහොත් ලබා ගැනීමට ඇති චේතනයක් ප්‍රතිඵලය කොටගෙන පහත දැක්වෙන කිසිවක් කරන්නේ නම්, ඔහු තක්සේරුකරුවකු ලෙස වෘත්තියෙහි යෙදෙන්නකු වේතැයි සැලකිය යුතුය :—

(අ) නිශ්චල දේපළ තක්සේරුකරණයෙහි යෙදීම හෝ තමා නිශ්චල දේපළ තක්සේරුකරුවෙකැයි මහාජනයා හමුවෙහි හුවා දැක්වීම ; හෝ

(ආ) නිශ්චල දේපළ තක්සේරුකරණය පිළිබඳ මූලධර්ම හෝ විස්තර ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් වෘත්තීය සේවය හෝ සහාය ලබාදීම; හෝ

(ඇ) යම් නිශ්චල දේපළක වටිනාකම පිළිබඳ වාර්තාවක් සහතික කිරීම; හෝ

(ඈ) තක්සේරුකරුවකු ලෙස වෘත්තියෙහි යෙදීමක් ලෙස සභාව විසින් නියම කළ හැකි වෙනත් යම් සේවයක් කිරීම.

වරදවල්

**26.** (1) මේ පනතේ 24 වන වගන්තියේ විධිවිධාන කිසිවක් පිළිපැදීම නොසලකා හරින හෝ පැහැර හරින සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි හය මාසය කට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දහස් පන්සියයකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කරනු ලැබීම හා ඒ දඩය යන දඬුවම් දෙකට ම ඒ තැනැත්තා යටත් වන්නේය.

(2) මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක් වූ විට—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වුවහොත් ඒ සංස්ථාවේ සෑම සාමාජිකයෙක් හා නිලධරයෙක් ම, හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් වුවහොත් ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවෙක් ම,

ඒ වරදට වරදකරු වන්නේය:

එසේ වුව ද ඒ සංස්ථාවේ සාමාජිකයකු හෝ නිලධරයකු හෝ ඒ ව්‍යාපාරික ආයතනයේ හවුල්කරුවකු හෝ විසින්, තමා නොදැනු වත් ව ඒ වරද කළ බව නැතහොත් ඒ වරද සිදුවීම වැළැක්වීම පිණිස තමා නිසි උද්‍යෝගයෙන් කටයුතු කළ බව ඔප්පු කරනු ලැබුව හොත්, ඔහු ඒ වරදට වරදකරු නොවන ලෙස සැලකිය යුතුය.

පැමිණිලි සඳහා අනුමතිය.

**27.** සභාවේ සභාපති විසින් තත්කාර්යය සඳහා ලිඛිත ව බලය පවරන ලද සභාවේ සාමාජිකයකු හෝ නිලධරයකු විසින් හැර මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් කිසිම නඩුවක් ඉදිරිපත් නොකළ යුතුය.

මුදල්.

**28.** ආයතනයේ මූලික ප්‍රාග්ධනය රුපියල් එක්ලක්ෂ පනස් දාහක් විය යුතු අතර එය ඒකාබද්ධ අරමුදලින් ආයතනය වෙත පරිත්‍යාග කළ යුතුය.

ආයතනයේ අරමුදල.

**29.** (1) ආයතනයට ආයතනයේ ම අරමුදලක් තිබිය යුතුය.

(2) පහත දැක්වෙන මුදල් ප්‍රමාණ ආයතනයේ අරමුදලට ගෙවිය යුතුය:—

(අ) ආයතනයේ පරිහරණය සඳහා කලින් කල ජාතික රාජ්‍ය සභාව විසින් යෝජනාවක් මගින් වෙන් කර දිය හැකි සියලු ම මුදල් ප්‍රමාණ; සහ

(ආ) ආයතනය විසින් සිය බලතල පාවිච්චි කිරීමේ දී හා යුතුකම් ඉටු කිරීමේ දී ලබන සියලු ම මුදල් ප්‍රමාණ.

ආයතනයේ මුදල් වර්ෂය.

30. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේ ය.

1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ කිරීම.

31. 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, ආයතනයේ මුදල් පාලනය වත් ගිණුම්වලටත් අදාළ වන්නේ ය.

## 'අ' උපලේඛනය

සංස්ථාගත සාමාජිකයන් ලෙස බඳවා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම. (15 වන වගන්තිය)

1. සංස්ථාගත සාමාජික පන්තියේ යම් ශ්‍රේණියකට බඳවා ගැනීම සඳහා කෙරෙන සෑම ඉල්ලීමක් ම—

(1) (අ) සභාව සංස්ථාපනය කිරීමට පෙර නම්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ හා ශ්‍රී ලංකාව තුළ ප්‍රචාරය කෙරෙන දෛනික ප්‍රවෘත්ති පත්‍ර දෙකක පළ කරනු ලබන දැන්වීමක් මගින් නියම කෙරෙන දිනයක හෝ ඉන් පෙර නාම ලේඛනගත කිරීමේ නිලධරයා වෙත යැවිය යුතුය; නැතහොත්

(ආ) සභාව සංස්ථාපනය කිරීමෙන් පසු නම්, සභාවේ ලේකම් වෙත යැවිය යුතුය;

(2) අවස්ථාමෝචිත පරිදි නාම ලේඛනගත කිරීමේ නිලධරයා විසින් හෝ සභාවේ ලේකම් විසින් තත්කාර්යය සඳහා සපයනු ලබන ආකෘතියක් අනුව විය යුතුය;

(3) ඉල්ලුම්කරු එම ශ්‍රේණියෙහි නාම ලේඛනගත කරනු ලැබීම සඳහා යෝග්‍ය වනුයේ කවර සුදුසුකම් අනුව ද යනු ප්‍රකාශ කෙරෙන්නක් විය යුතු අතර ඒ සුදුසුකම් දිවුරුම් පත්‍රකින් සනාථ කළ යුතුය;

(4) ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතුය;

(5) නියම ඉල්ලුම්පත් ගාස්තුව, ඇතුළත්වීමේ ගාස්තුව හා සාමාජික මුදල සමග යැවිය යුතුය; තව ද

(6) සභාව සංස්ථාපනය කරනු ලැබීමෙන් පසු යවනු ලැබේ නම්, සභාවේ සාමාජිකයන් දෙදෙනකු විසින් නැතහොත් එක් සාමාජිකයකු පණිවිඩගණ වූ ද එක් සාමාජිකයකු උපාධිධර වූ ද ඉල්ලුම්කරු බඳවා ගනු ලැබීමට අපේක්ෂා කරන ශ්‍රේණියට බඳවා ගනු ලැබූ සාමාජිකයන් දෙදෙනකුට නො අඩු වූ ද අයුරින් ආයතනයේ සාමාජිකයන් හතර දෙනකු විසින් නිර්දේශ කළ යුතුය.

සංස්ථාගත නොවූ සාමාජිකයන් ලෙස නාම ලේඛනගත කරනු ලැබීම සඳහා ඉල්ලුම් කිරීම.

2. (1) සංස්ථාගත නොවූ සාමාජික පන්තියේ යම් ශ්‍රේණියකට බඳවා ගැනීම සඳහා කෙරෙන සෑම ඉල්ලීමක් ම—

(අ) සභාව සංස්ථාපනය කරනු ලැබීමෙන් පසු නම්, තත්කාර්යය සඳහා සභාවේ ලේකම් විසින් සපයනු ලබන ආකෘතියක් අනුව යැවිය යුතුය;

(ආ) ඉල්ලුම්කරු එම ශ්‍රේණියෙහි නාම ලේඛනගත කරනු ලැබීම සඳහා යෝග්‍ය වනුයේ කවර සුදුසුකම් අනුව ද යනු ප්‍රකාශ කෙරෙන්නක් විය යුතු අතර ඉල්ලුම් කරනුයේ ගරු සාමාජික ශ්‍රේණියේ හැර වෙන යම් ශ්‍රේණියක නාම ලේඛනගත කරනු ලැබීම සඳහා වූ අවස්ථාවක, ඒ සුදුසුකම් දිවුරුම් පත්‍රකින් සනාථ කළ යුතුය.

(ඇ) ඉල්ලුම්කරු විසින් අත්සන් කළ යුතුය;

(ඈ) ගරු සාමාජික ශ්‍රේණිය හැර වෙන යම් ශ්‍රේණියක නාම ලේඛනගත කරනු ලැබීම සඳහා වූ ඉල්ලීමක් වන අවස්ථාවක, නියම ඉල්ලුම්පත් ගාස්තුව, ඇතුළත්වීමේ ගාස්තුව හා සාමාජික මුදල සමග ද ඉල්ලීම කරන ලද්දේ ගරු සාමාජිකයකු ලෙස නාම ලේඛනගත කරනු ලැබීම සඳහා වූ අවස්ථාවක, නියම සාමාජික මුදල සමග ද යැවිය යුතුය; තව ද

(ඉ) යටත් පිරිසෙයින් සංස්ථාගත සාමාජිකයන් දෙදෙනකු විසින් එය නිර්දේශ කළ යුතුය.

(2) යම් ශ්‍රේණියක නාම ලේඛනගත කරනු ලැබීම සඳහා යෝග්‍ය වූ යම් තැනැත්තකුගේ ඉල්ලීම මේ රීතියේ විධිවිධානවලට අනුකූල වේ නම් ඔහු එම ශ්‍රේණියට බඳවා ගත හැකිය.

(3) සභාව සංස්ථාපනය කිරීමට පෙර නාමලේඛනගත කරනු ලැබීම සඳහා කරන ලද ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම පිණිස නාම ලේඛනගත කිරීමේ නිලධරයකු අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

ගාස්තු.

3. (1) යම් ශ්‍රේණියක් සම්බන්ධයෙන් ගෙවිය යුතු ඉල්ලුම් පත්‍ර ගාස්තුව, ඇතුළත් වීමේ ගාස්තුව, වාර්ෂික සාමාජික මුදල හා අලුත් කිරීමේ ගාස්තුව පහත දක්වෙන පරිදි විය යුතුය:—

| ශ්‍රේණිය | ඉල්ලුම් පත්‍ර ගාස්තුව | ඇතුළත්වීමේ ගාස්තුව | වාර්ෂික සාමාජික මුදල | අලුත් කිරීමේ ගාස්තුව |
|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| පණ්ඩිතගණ ... ... | 5 0 ... | 150 0 ... | 240 0 ... | 240 0 |
| උපාධිධර ... ... | 5 0 ... | 125 0 ... | 200 0 ... | 200 0 |
| ආශ්‍රිත ... ... | 5 0 ... | 50 0 ... | 120 0 ... | 120 0 |
| අධිකාරලාභී ... ... | 5 0 ... | 40 0 ... | 75 0 ... | 75 0 |
| පරිවාස ... ... | 5 0 ... | 30 0 ... | 50 0 ... | 50 0 |
| ආධුනික ... ... | 2 50 ... | 25 0 ... | 10 0 ... | 10 0 |
| ගරු ... ... | — ... | — ... | — ... | — |

(2) යම් සාමාජිකයකු නාම ලේඛනගත කරනු ලැබූ ශ්‍රේණියට වඩා උසස් ශ්‍රේණියක නාම ලේඛනගත කරනු ලැබීම සඳහා ගෙවිය යුතු ඇතුළත්වීමේ ගාස්තුව හා වාර්ෂික සාමාජික මුදල ඒ ඒ ඇතුළත්වීමේ ගාස්තු හා ඒ ඒ වාර්ෂික සාමාජික මුදල් අතර ඇති වෙනස විය යුතුය.

නාම ලේඛන.

4. (1) සංස්ථාගත සාමාජිකයන් ලෙස නාම ලේඛනගත කරනු ලබන තැනැත්තන් වෙනුවෙන් එකක් ද සංස්ථාගත නොවූ සාමාජිකයන් ලෙස නාම ලේඛනගත කරනු ලබන තැනැත්තන් වෙනුවෙන් තවත් එකක් ද යනුවෙන් ලේඛන දෙකක් තිබිය යුතුය. එක් එක් ලේඛනය වෙන් වෙන් වශයෙන් කොටස් වලට බෙදිය යුතු අතර එක් එක් කොටස ලේඛනය අදාළ සාමාජික පන්තියේ විවිධ ශ්‍රේණි සම්බන්ධයෙන් විය යුතුය. තවද ඒ එක් එක් කොටසෙහි එම ශ්‍රේණියෙහි නාම ලේඛනගත කරනු ලැබූ තැනැත්තන්ගේ නම්, ලිපිනය සහ සුදුසුකම් ඇතුළත් විය යුතුය.

(2) සභාව සංස්ථාපනය කරනු ලබන තෙක් සංස්ථාගත සාමාජිකයන්ට අදාළ ලේඛනය, නාම ලේඛනගත කිරීමේ නිලධරයා විසින් ද ඉන්පසු සභාව උදෙසාත්, වෙනුවෙනුත් සභාවේ ලේකම් විසින් ද පවත්වා ගෙන යා යුතුය.

(3) සංස්ථාගත නොවූ සාමාජිකයන්ට අදාළ ලේඛනය සභාව උදෙසාත්, වෙනුවෙනුත් සභාවේ ලේකම් විසින් පවත්වා ගෙන යා යුතුය.

සාමාජිකත්වය නතරවීම.

5. (1) ආයතනයේ සාමාජිකයකු ලෙස තැනැත්තකු නාම ලේඛනගත කිරීම, ඒ නාම ලේඛනගත කිරීමේ දින සිට එක් අවුරුදු කාල සීමාවක් බල පැවැත්වේ.

(2) තමාගේ නම නාම ලේඛනගත කිරීම වලංගු කාල සීමාව ඉකුත් වීමට පෙර ආයතනයේ සාමාජිකයකු විසින් අලුත් කිරීමේ ගාස්තුව ගෙවීම පැහැර හරිනු ලැබුවහොත්, අලුත් කිරීමේ ගාස්තු වශයෙන් ඔහු ගෙවිය යුතු සියලුම මුදල් ගෙවනු ලබන තෙක් සාමාජිකයකු ලෙස ඔහු සතු සියලුම අයිතිවාසිකම් හා වරප්‍රසාද ඔහුට අහිමි වන්නේය. ඒ කාල සීමාව ඉකුත් වීමෙන් පසු අවුරුදු දෙකක් ඇතුළත ඒ මුදල් ගෙවීම ඔහු පැහැර හැරියහොත් ඔහුගේ නම ලේඛනයෙන් ඉවත් කළ යුතුය.

(3) (2) වන අනුච්ඡේදයේ විධිවිධාන යටතේ ලේඛනයෙන් නම කපා ඉවත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඉල්ලුම් පත්‍ර ගාස්තුව, ඇතුළත්වීමේ ගාස්තුව හා සාමාජික මුදල යන මේවාට අතිරේකව, තම නම ලේඛනයෙන් ඉවත් කරනු ලැබූ දින දක්වා අලුත් කිරීමේ ගාස්තු වශයෙන් ඔහුගෙන් අය විය යුතුව තිබූ සියලු ම මුදල් ගෙවනු ලැබුවහොත් පසුව ඔහු නැවත නාම ලේඛනගත කරනු ලැබිය හැකිය.

## 'අ' උපලේඛනය

6. පහත දැක්වෙන එක් එක් ක්‍රියාවෙන් හෝ අක්‍රියාවෙන් තක්සේරු කරුවකුගේ විෂමාචාරය ඇති වන්නේ ය:— 22 වන වගන්තිය.

(1) චක්‍රලේඛයක්, පළකිරීමක්, පෞද්ගලික පණිවුඩ හුවමාරුවක් හෝ සම්මුඛ සාකච්ඡාවක් මගින් නැතහොත් වෙන යම් ක්‍රමයකින් කෙළින්ම හෝ අන් අයුරකින් සේවාර්ථීන්ගෙන් වැඩ ඉල්ලා සිටීම හෝ වෘත්තිය වැඩ ඉල්ලා සිටීම;

(2) යම් වෘත්තිය වැඩක් සම්බන්ධයෙන් ලාභවලින් ප්‍රතිශතයක් පදනම් කර ගෙන ගාස්තු අය කිරීම;

(3) ආයතනයේ සංස්ථාගත සාමාජිකයකු හෝ විශ්‍රාමලත් හවුල්කරුවකු හෝ ඒ හවුල්කරු විසින් නම් කරනු ලැබුවකු හෝ ඒ හවුල්කරුගේ නෛතික නියෝජිතයකු හැර වෙන යම් තැනැත්තකුට, තමාගේ වෘත්තිය සේවා සඳහා වූ ගාස්තු හෝ ලාභවලින් යම් කොටසක්, කොමිසමක් හෝ තැරැව් ගාස්තුවක් කෙළින්ම හෝ අන් අයුරකින් ගෙවීම හෝ ගැනීමට ඉඩ හැරීම හෝ ගෙවීමට හෝ ගැනීමෙහි ලා ඉඩ හැරීමට එකඟ වීම;

(4) ආයතනයේ සංස්ථාගත සාමාජිකයකු නොවූ යම් නීතිඥයකුගේ, වෙන්දේසිකරුවකුගේ, තැරැව්කරුවකුගේ හෝ වෙන යම් නියෝජිතයකුගේ වෘත්තිය වැඩට අයිති ගාස්තු හෝ ලාභවලින් යම් කොටසක් භාර ගැනීම හෝ භාර ගැනීමට එකඟවීම;

(5) ආයතනයේ සංස්ථාගත සාමාජිකයකු වන්නා වූ ද තමන් හා හවුල් ව්‍යාපාර යක යෙදී හෝ තමන් විසින් සේවයෙහි යොදනු ලැබ හෝ සිටින්නාවූ ද තැනැත් තකු නොවන අන් කිසි තැනැත්තකුට තක්සේරුකරුවකු ලෙස ඇම නමින් වෘත්තියෙහි යෙදීමට ඉඩ දීම;

(6) යම් වෘත්තිය වැඩක් ලබා දීම හෝ සැපයීම සඳහා පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් යම් තැනැත්තකුට යම් තුටු පඬුරක් පිරිනැමීම;

(7) ආයතනයේ සංස්ථාගත වෙන යම් සාමාජිකයකු විසින් කලින් භාර ගන්නා ලද යම් වැඩක් ඒ සංස්ථාගත සාමාජිකයාගේ නියෝජිතයකු වශයෙන් හැර අන් ලෙසකින් හෝ පළමුව ඔහු හා ලියවිල්ලකින් අදහස් හුවමාරු කර නොගෙන, භාර ගැනීම;

(8) යම් කාරණයක දී යම් තැනැත්තකුගේ ස්වාර්ථය, ඒ කාරණය සම්බන්ධ යෙන් වෘත්තිය වැඩ දී ඇති වෙන යම් තැනැත්තකුගේ ස්වාර්ථවලට පටහැනි වූ අවස්ථාවක, ඒ කාරණය සම්බන්ධයෙන්ම මුලින් කී තැනැත්තාගෙන් යම් වෘත්තිය වැඩක් භාර ගැනීම හෝ භාර ගැනීමට එකඟ වීම;

(9) යම් වෘත්තිය වැඩක් කරන අතරතුර ලබා ගත් තොරතුරු අනාවරණය කරන ලෙස තමන් වෙත ඒ වැඩය භාර දුන් තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයා හෝ අධිකරණයක් හෝ මේ පනත යටතේ පත් කරන ලද බේරුම් කිරීමේ මණ්ඩලයක් හෝ කොමිසමක් හෝ විසින් නියම කරනු ලබන විටක හැර, එසේ අනාවරණය කිරීම;

(10) තම වෘත්තිය වැඩ කරන අතරතුර යම් වාර්තාවක් හෝ ප්‍රකාශයක් තමන් විසින් ම හෝ තම සමාගමේ හවුල්කරුවකු විසින් හෝ එහි සේවකයකු විසින් පිළියෙළ කරනු ලැබුවේ නම් මිස ඒ වාර්තාව හෝ ප්‍රකාශය තම නමින් ම හෝ තම සමාගමේ නමින් සහතික කිරීම හෝ ඉදිරිපත් කිරීම;

(11) තම වෘත්තිය වැඩ කිරීමේ දී ඇබ් ලෙස නොසැලකිලිමත් වීම;

(12) මතයක් ප්‍රකාශ කිරීම උදෙසා ප්‍රමාණවත් ලෙස තොරතුරු ලබා ගැනීම පැහැර හැරීම;

(13) වෙන යම් තක්සේරුකරුවකුගේ වෘත්තිය ප්‍රසිද්ධිය හෝ කුශලතාව අපකීර්තියට ලක් කිරීම හෝ අපකීර්තියට ලක් කිරීමට තැත් කිරීම; හා

(14) තම වෘත්තිය සම්බන්ධව හෝ සේවා ප්‍රචාරය කිරීම.